මගේ අංකය - සිආදෙ/3/5/2 –I

චක්‍රලේඛ අංක -06/2017

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
බම්බලපිටිය.

2017.04.11

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
සියළුම අධ්‍යක්ෂවරුන් / නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් / සහකාර අධ්‍යක්ෂවරුන්,
මූලස්ථාන මාණ්ඩලික නිලධාරී,
සියළුම බලකා අණදෙන නිලධාරීන් / පුහුණු පාසල් අණදෙන නිලධාරීන්,
සහ ව්‍යාපෘති භාර නිලධාරීන්

**සිවිල් ආරක්‍ෂක සාමාජික සාමාජිකාවන්ගේ රාජකාරී නිල මුද්‍රා භාවිතය සීමා කිරීම**

මෙම දෙපාර්තමේන්තුවේ රාජකාරී නියුතු සිවිල් ආරක්‍ෂක සාමාජික සාමාජිකාවන් දෙපාර්තමේන්තුව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත නොකළ සහ විධිමත්ව පත් නොකළ තනතුරු නාම භාවිතා කරමින් රාජකාරී කටයුතු වලදී සහ වෙනත් බාහිර පාර්ශව සමඟ කෙරෙන කටයුතු සඳහා ද නිල මුද්‍රා භාවිතා කරන බව නිරීක්‍ෂණය වී ඇත. මේ අයුරින් අනුමත නොමැති තනතුරු නාම (උදා-: ස්ථාන භාර නිලධාරී, ගොවිපොල භාර නිලධාරී, ව්‍යාපෘති භාර නිලධාරී) නිල මුද්‍රා සඳහා යෙදිය නොහැකි අතර ජ්‍යෙෂ්ඨ නියාමක නමින් තනතුරක් දෙපාර්තමේන්තුව සඳහා අනුමතව නොමැති බැවින් ජ්‍යෙෂ්ඨ නියාමක ලෙස සඳහන් කරමින් නිල මුද්‍රා භාවිතා කිරීමද සිදු කළ නොහැක. ඒ අනුව ඉහත දැක්වෙන අයුරින් යම් අයෙක් විසින් නිල මුද්‍රා භාවිතා කරයි නම්, එලෙස භාවිතා කිරීම සම්පූර්ණයෙන්ම නැවැත්වීමට කටයුතු කළ යුතු ය.

02. නමුත්, දෙපාර්තමේන්තුවේ සංගම් (උදාහරණ - ආගමික සංගමය, සුභසාධක අරමුදල වැනි) සඳහා භාවිතා වන තනතුරු නාම වන සභාපති, ලේකම්, භාණ්ඩාගාරික සහ කාරක සභික වැනි තනතුරු සඳහා පමණක් අදාල සංගම්හි ව්‍යවස්ථාවන් ප්‍රකාරව සහ කාලීනව මහ සභා රැස්වීම්හිදී ගනු ලබන තීරණ අනුව නිල මුද්‍රා භාවිතා කළ හැකි වේ.

03. දිස්ත්‍රික් නිලධාරීන් විසින් තම අනුමත තනතුරු නාමය යොදා ගනිමින් භාවිතා කරනු ලබන නිල මුද්‍රා සඳහා උක්ත නියමයන් බලනොපවත්වන බවත්, ඉදිරියේදී දෙපාර්තමේන්තුවේ යම් අනුමත තනතුරක් සඳහා යම් අයෙක් විසින් නිල මුද්‍රා යොදා ගන්නේ නම් ඒ පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල් අනුමැතිය ලබා ගත යුතු බවත් දන්වා සිටිමි.

04. මෙම චක්‍රලේඛයේ විධිවිධාන 2017.04.01 දින සිට ක්‍රියාත්මක විය යුතු බවත් මින් වැඩිදුරටත් දන්වා සිටිමි.

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
නො: 23, දුම්රියපොළ පාර,
බම්බලපිටිය, කොළඹ-04.

පිටපත-:

I. ලේකම්, ආරක්‍ෂක අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.